සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 8 - ශ්‍රේණිය

## චිත්‍ර කලාව

**නම/විභාග අංකය :- ..........................................................** **කාලය: පැය 02යි.**

## I කොටස

- ලකුණු 1 බැගින් ලකුණු 30 යි.

- පහත සඳහන් ඡායාරූපය උපයෝගි කරගෙන අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.



(01) ශ්‍රී ලංකාවේ පාරම්පරික කලා කර්මාන්තයක් ලෙස .................................. කර්මාන්තය හඳුන්වනු ලබයි.

(02) ඡායාරූපයෙන් .............................................. ක්‍රමය අනුව භාණ්ඩ නිෂ්පාදනය කරන අයුරු නිරූපිතයි.

(03) තඹ සහ ........................................... එකතු කොට මෙම මාධ්‍ය සකසා ගනු ලබයි.

(04) මෙම ශිල්ප ක්‍රමය අනුව තනාගන්නා භාණ්ඩයක් ලෙස ................................................ හඳුන්වා දිය හැක.

(05) මෙම කර්මාන්තය දකුණු පළාතේ බෙලිඅත්ත ..................................... නම් ග්‍රාමයේ ව්‍යාප්තව ඇත.

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් ආසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**

(06) මැටි කර්මාන්තයේ වඩාත් ගුණාත්මකම මැටි වර්ගය වන්නේ

i. කෙයොලින් මැටිය ii. රතු මැටිය

iii. කහ මැටිය iv. කිරිමැටිය

(07) අනුරාධපුර යුගයේ මහමේව්නාවේදී මුල්ම කොහොඹා කංකාරිය ශාන්ති කර්මය පැවැත් වූ බවට සාධක ගෙන දෙන මූලාශ්‍රය වන්නේ.

i. පූජාවලියයි ii. මහාවංශයයි

iii. චූලවංශයයි iv. රාජාවලියයි

(08) තලය විනිවිද පෙනීමේ ශිල්ප ක්‍රමය දැකිය හැකි මාධ්‍ය වන්නේ.

i. පැස්ටල් ii. දියසායම්

iii. කොලාජ් iv. තෙල්සායම්

(09) 'තෛමින්කිය' යනු කුමන ආගමික පූජා විධික්‍රමයක්ද?

i. ඉස්ලාම් ආගම ii. බෞද්ධ ආගම

iii. හින්දු ආගම iv. කතෝලික ආගම

(10) විවිධ හැඩ මතුවන සේ කලාත්මකව අත් අකුරු ලිවීමේ කලාව.

i. පුස්කොල අකුරු ii. කැලිග්‍රැෆි (Calligraphy)

iii. හයරොග්ලිපික්ස් (Hieroglyphics) iv. බ්‍රාහ්මීය අක්ෂර

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති වගන්ති නිවැරදි නම් ✓ ලකුණ ද, වැරදි නම් × ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(11). කතිරිමල නාලොවට අයත් මලක් යැයි සැලකේ. (..................)


(12). තොරන්පෙත්ත දෙවොල්මඩුව හා බැඳි කලා කර්මාන්තයකි (..................)

(13). මිනාර් මස්ජිදය හා සම්බන්ධ ගෘහ නිර්මාණ අංගයකි. (..................)

(14). පාදම හා ධාතු ගර්භය අතර පේසා වළලු පිහිටා ඇත. (..................)

(15). අඩි 17 ක් දිග බයිසන් ගව රුව අල්ටමීරා ගුහාවේ සිතුවම් කර ඇත. (..................)

- **දී ඇති රූප සටහන් ඇසුරින් අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**



A B C D E

(16). E අක්ෂරයෙන් දැක්වෙන මුද්‍රාව කුමක්ද? (..................)

(17). B අක්ෂරයෙන් දැක්වෙන ස්ථූපයෙහි නම කුමක්ද? (..................)

(18). A අක්ෂරයෙන් දැක්වෙන රූපවාහිනී මාධ්‍ය තුළද ඉතා ජනප්‍රිය කලාකෘතිය කුමක්ද? (..................)

(19). C අක්ෂරයෙන් දැක්වෙන සැලැස්ම කිනම් ආගමකට අයද් ද? (..................)

(20). D අක්ෂරයෙන් දැක්වෙන සිංහල සැරසිල්ල හඳුන්වනු ලබන්නේ කුමන නමකින්ද? (..................)

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති වචන පැහැදිලි වන සේ වාක්‍ය තනන්න.**


(21). කෝගුල් ..............................................................................................................................................

(22). සංඛනිධි ..............................................................................................................................................

(23). ඇතා හා පැටවා ..............................................................................................................................................

(24). සකාතුල් ෆිත්රා ..............................................................................................................................................

(25). මුළුතල සැරසිලි ..............................................................................................................................................



- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති ශීර්ෂ යටතේ මෙම කලාකෘතිය කලාත්මක ඇගයීමට ලක් කරන්න.**

(26). අයත් සම්ප්‍රදාය ..............................................................................................................................................

(27). ශාන්තිකර්මය ..............................................................................................................................................

(28). ප්‍රධාන සැරසිලි අංගය ..............................................................................................................................................

(29). ප්‍රථම ශාන්තිකර්මය පැවැත් වූ ස්ථානය ..............................................................................................................................................

(30). සැරසිලි සඳහා භාවිත අමුද්‍රව්‍ය..............................................................................................................................................

(ලකුණු 30)

## II කොටස - ද්‍රව්‍ය බලා ඇඳීම

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය පැන්සලෙන් පමණක් චිත්‍රනය කරන්න.
- ද්‍රව්‍ය වල ස්වභාවය, එළිය අඳුර පර්වායලෝකන ලක්ෂණ පෙනෙන සේ කොළයට සම්පීඩනය කර අදින්න. ( ල . 20 )

## III කොටස කාලය

◆ **ඔබ කැමති එක් මාතෘකාවක් තෝරාගෙන එක් චිත්‍රයක් පමණක් ඇඳ වර්ණ කරන්න..**

''අ'' කොටස - සංරචනය

1. නිවාඩු දවසක මුහුදු වෙරළ

   රැල්ල පාගන වැඩිහිටියන් හා ළමුන්, සරුංගල් යවන ළමුන්, විවිධ ක්‍රියාකාරකම්හි යෙදෙන පිරිස, විඩාහරින මහළු අය, වෙළෙන්දන් වැනි අය යොදාගෙන ලස්සන චිත්‍රයක් අඳින්න.

2. පාසලේ ක්‍රීඩා උත්සවය.

   ක්‍රීඩා කරන සිසුන්, ඔවුන් දිරිමත් කරන පිරිස, විඩාහරින ක්‍රීඩකයන්, ඔවුන්ට උදව් කරන යහළුවන්, වෙළඳාම් කරන පිරිස්, තරඟ විනිසුරුවන් වැනි අය යොදාගෙන නිර්මාණයක් කරන්න.

3. ගමේ වෙලේ ඉපනැල්ලේ නිදහසේ සැරිසරන ගව රංචුවක්

''ආ'' කොටස - මෝස්තර

4. සාරිපල්ලුවක් - ඔබ කැමති ලස්සන මෝස්තර යොදා නිර්මාණය කරන්න.
5. සුදුසු මෝස්තරයක් යොදා ත්‍යාග දවටනයක් නිර්මාණය කරන්න.
6. සරම් වාටියක් නිර්මාණය කරන්න.

''ඇ'' කොටස - ග්‍රැෆික්

7. ''විෂබීජ වලින් ආරක්ෂා වෙමු'' යන සංකල්පය යටතේ පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කරන්න.
8. උපන් දිනයට සුදුසු සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න. ( ල . 50 )

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

**8 - ශ්‍රේණිය**


**චිත්‍ර කලාව - ද්‍රව්‍ය බලා ඇඳීම**

කාලය පැය ½ යි.
ලකුණු 20 යි.

සිසුන්ට පැන්සලින් පමණක් චිත්‍රණය කිරීමට උපදෙස් ලබාදෙන්න. ලබා දී ඇති ආදර්ශය අනුව ද්‍රව්‍ය සම්පිණ්ඩනය සිදු කරන්න. ද්‍රව්‍ය සමූහය ඇස් මට්ටමින් පහළ සිටින ලෙසත් කොල / කොල ඉත්ත ඇස් මට්ටමින් ඉහළ සිටින ලෙසත් පිළියෙල කරන්න.

යෝජිත ද්‍රව්‍ය : (අවශ්‍යනම් විකල්ප සපයා ගන්න)

1. පෙට්ටියක් (මාරි බිස්කට් පෙට්ටියක් - උස 10 cm පළල 25 cm දිග 28 cm පමණ)
2. වොලි බෝලයක්
3. සැමන් ටින් එකක්
4. කොළ 5 ක පමණ වද ඉත්තක්
5. ධාරකයක්.



සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

### 8 - ශ්‍රේණිය

### චිත්‍ර කලාව පිළිතුරු පත්‍රය

**I පත්‍රය**

(01) පිත්තල

(02) පස් වාත්තු ක්‍රමය, වාත්තු ක්‍රමය

(03) තුත්තනාගම්

(04) පහන / මල් පෝච්චිය / සෙම්බුව

(05) අඟුල් මඩුව

(06) කෙයොලින් මැටි

(07) රාජාවලිය

(08) දියසායම්

(09) හින්දු ආගමික

(10) කැලිග්‍රැෆි (Calligraphy)

(11) X (12) X (13) ✓ (14) ✓ (15) X

(16) විතර්ක මුද්‍රාව (17) රුවන්මැලිසෑය (18) රිටි රුකඩ

(19) කිතුනු ආගමට අයත් වේ. (20) සැරපෙන්දියා

(21) යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර ඇති ස්ථානයකි, ගුහාවකි.

(22) අභයගිරි දාගැබට අයත් මුර ගලකි.
සංඛයක් අතින් ගත් හෝ සංඛ හිස්වැස්මක් සහිත වාමන රූපයක්.

(23) දොරවක ලෙනේ ඇති ප්‍රාග් ඓතිහාසික සිතුවමකි.
ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ලාංකේය සිතුවමකි.

(24) රාමසාන් උත්සව දින දී සිදු කරන දානමය පිංකම.

(25) යම් සීමාවකින් අවසන් වන සැරසිලි.
මුබතල මෝස්තරයක් යෙදෙන අවස්ථාවක් ලියූ විටද ලකුණු දෙන්න. උදා:- මේස රෙද්දක දැකිය හැකි මෝස්තරයක්

(26) සබරගමුව සම්ප්‍රදායට අයත් වේ.

(27) පහන් මඩුව ශාන්තිකර්මය මින් නිරූපිතයි.

(28) මඩුව සැරසීම ප්‍රධාන සැරසිලි අංගය වේ.

(29) රුවන්වැල්ල ප්‍රදේශය ආශ්‍රිතව මුල්ම ශාන්තිකර්මය පවත්වා ඇත.

(30) දෙවොල් දෙවියන් හා පත්තිනි දෙවඟන මුල් කරගෙන මෙම ශාන්තිකර්මය පැවැත්වේ.